JMC vLearning
"your virtual learning partner"

# මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

## AAT අදියර I
FAC - මූල්‍ය ගිණුම්කරණය

සංදීප ජයසේකර
MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, FCA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917


JMC vLearning
“your virtual learning partner”

# AAT 01 – මූල්‍ය ගිණුම්කරණය


## පරිච්ඡේදය - 04
## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, FCA, ACCA (UK), SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



## තනි පුද්ගල ව්‍යාපාර


ගිණුම්කරණ ක්‍රියාවලිය
ව්‍යාපාරය
ගනුදෙනු සහ සිදුවීම්
තනි පුද්ගල ව්‍යාපාර
හවුල් ව්‍යාපාර
සමාගම්
JMC Jayasekera Management Centre (Pvt) Ltd


13%
41%
තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම
Sandeepa Jayasekera - JMC
4

# තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ

## ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ලාභාලාභ ගිණුම තුලින් සළකා බලන කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රගතිය ගණනය කරයි. මූල්‍ය ප්‍රගතිය යන ලාභ වේ. වර්ෂයේ ආදායම් තුලින් වියදම අඩු කර ලාභය ගණනය කරයි

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුලින් වාර්තාකරණ දිනයට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය හෙවත් වත්කම්, වගකීම් සහ හිමිකම් අතර සම්බන්ධය නිරූපණය කරයි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මූලික ගිණුම්කරණ සමීකරණයට අනුව පිළියෙල කෙරේ.




JMC vLearning
"your virtual learning partner"

## ලාභාලාභ ගිණුම තුල තිබෙන අයිතම

### ආදායම්

| විකුණුම් | වෙනත් ආදායම් |
| --- | --- |
| | |

JMC vLearning
"your virtual learning partner"

## ලාභාලාභ ගිණුම තුල තිබෙන අයිතම

| විකුණුම් පිරිවැය | විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් |
| --- | --- |
| | |

| පරිපාලන වියදම් | මූල්‍ය වියදම් | වෙනත් වියදම් |
| --- | --- | --- |
| | | |

# ලාභාලාභ ගිණුම ප්‍රධාන කොටස් 2කි

## වෙළඳ ගිණුම

වෙළඳ ගිණුම තුල විකුණුම් සහ විකුණුම් පිරිවැය අතර වෙනස දළ ලාභය පෙන්වයි.

| | |
|---|---|
| විකුණුම් | XXX |
| (-) විකුණුම් පිරිවැය | (XX) |
| දළ ලාභය | XX |

## ලාභාලාභ ගිණුම

ලාභාලාභ ගිණුම තුල දළ ලාභයේ සිට ශුද්ධ ලාභය දක්වා පෙන්වයි

| | |
|---|---|
| දළ ලාභය | XXX |
| + වෙනත් ආදායම් | XX |
| (-) වියදම් | (XX) |
| ශුද්ධ ලාභය | XX |



# තනි පුද්ගල ව්‍යාපාරයක වෙළඳ ගිණුමේ ආකෘතිය

ABC ව්‍යාපාරය
31/3/X4න් අවසන් වර්ෂය සඳහා
වෙළඳ ගිණුම

| | | |
|---|---|---|
| විකුණුම් | XXX | |
| (-) විකුණුම් ආපසු එවුම් | (X) | XXX |
| විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | X | |
| ගැනුම් | XXX | |
| ගෙන ඒමේ කුලිය | X | |
| (-) තොග ගැනිලි | (X) | |
| (-) හානි වු තොගය | (X) | |
| (-) තොග පරිත්‍යාග | (X) | |
| (-) ගැනුම් ආපසු යැවුම් | (X) | |
| (-) අවසාන තොගය | (X) | (XXX) |
| දළ ලාභය | | XX |

# වෙළඳ ගිණුමේ ද්විත්ව සටහන්

| අයිතමය | විස්තරය | ද්විත්ව සටහන |
|---|---|---|
| විකුණුම් | විකුණුම් යනු ව්‍යාපාරයේ ප්‍රධාන ආදායමයි. ව්‍යාපාරයේ ප්‍රධාන භාණ්ඩය හෝ සේවාව අලෙවි කිරීමෙන් ලබන ආදායමයි. | විකුණුම් හර<br>වෙළඳ ගිණුම බැර |
| විකුණුම් ආපසු එවුම් | පාරිභෝගිකයා විසින් ව්‍යාපාරය වෙත ආපසු හරවා එවන ලද භාණ්ඩ වටිනාකම ආපසු එවුම් වේ. විකුණුම් ආපසු එවුම් විකුණුම් වලින් අඩු කර දක්වයි. | වෙළඳ ගිණුමේ හර<br>විකුණුම් ආපසු එවුම් බැර |
| අරම්භක තොගය | පෙර වර්ෂය අවසානයේ නොවිකිණී ඉතිරි වී තිබූ තොගය මේ වසරේ ආරම්භක තොගය බවට පත් වේ. ව්‍යාපාරයක් පළමුව අලෙවි කරන්නේ ආරම්භක තොගය බැවින් එය මෙම වර්ෂයේ විකුණුම් පිරිවැයට එකතු කෙරේ. | වෙළඳ ගිණුම හර<br>ආරම්භක තොගය බැර |

vLearning "your learning partner"

# වෙළඳ ගිණුමේ ද්විත්ව සටහන්

| අයිතමය | විස්තරය | ද්විත්ව සටහන |
|---|---|---|
| ගැනුම්/ගෙන ඒමේ කුළී සහ අනිකුත් සෘජු ගැනුම් වියදම් | ගැනුම් වියදම් වර්ෂයේ විකුණුම් පිරිවැයට එකතු විය යුතු වේ. එම ගැනුම් ව්‍යාපාරයට ගෙන ඒම සඳහා දරණ ලද ප්‍රවාහන වියදම සහ අනිකුත් ගැනුම් හා සෘජු වියදමක් වේ නම් එය විකුණුම් පිරිවැයට එකතු කළ යුතු වේ. | වෙළඳ ගිණුම හර<br>ගැනුම් බැර<br>ගෙන ඒමේ කුළී බැර<br>සජු වියදම් බැර |
| අවසාන තොගය | වර්ෂය තුල මිලදී ගත් අයිතම තුලින් කොටසක් වර්ෂය අවසාන වන විටත් නොවිකිණී ඉතිරිව තිබිය හැකිය. මෙය අවසාන තොගය ලෙස හැඳින්වේ. අවසාන ව්‍යාපාරය සතු වත්කමකි. එමෙන්ම එය නොවිකිණී ඇති නිසා එය විකුණුම් පිරිවැයෙන් අඩු කළ යුතුය. | අවසාන තොගය හර<br>වෙළඳ ගිණුම් බැර |

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 01

කමල්ගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඇසුරින් වෙළඳ ගිණුම් පිළියෙල කරන්න.

| | |
|---|---|
| ආරම්භක තොගය | 80,000 |
| අවසාන තොගය | 90,000 |
| ගැනුම් | 500,000 |
| විකුණුම් | 800,000 |
| ගැනුම් ආපසු යැවුම් | 60,000 |
| විකුණුම් ආපසු එවුම් | 70,000 |

## ප්‍රශ්න අංක 02

සමරපාලගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඇසුරින් වෙළඳ ගිණුම පිළියෙල කරන්න.

| | |
|---|---|
| 20x8/1/1 දිනට තොගය | 50,000 |
| 20x8/12/31 දිනට තොගය | 20,000 |
| ගැනුම් | 450,000 |
| විකුණුම් | 675,000 |
| ගෙන ඒමේ කුළී | 25,000 |
| ගෙන යාමේ කුළී | 50,000 |
| ගැනුම් ආපසු යැවුම් | 5,000 |
| විකුණුම් ආපසු එවුම් | 10,000 |
| තොග හානි | 7,000 |
| තොග ගැනිලි | 15,000 |
| තොග පරිත්‍යාග | 8,000 |

Sandeepa Jayasekera - JMC 15



## ලාභාලාභ ගිණුම්

JMC vLearning
"your virtual learning partner"

# තනි පුද්ගල ව්‍යාපාරයක ලාභාලාභ ගිණුමේ ආකෘතිය

ABC ව්‍යාපාරය
31/3/X4න් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ ගිණුම රු.000'

| | | |
|---|---|---|
| දළ ලාභය | | XXX |
| | | |
| වෙනත් ආදායම් | | |
| ලද වට්ටම් | X | |
| අයෝජන අදායම් | X | |
| ලද කොමිස් | X | |
| පොළී ආදායම් | X | X |
| | | |
| විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් | | |
| අලෙවිකරණය | X | |
| මෝටර් වාහන ක්ෂය | X | |
| බොල් ණය | XX | |
| දුන් වට්ටම් | X | (XX) |
| | | |

| | | |
|---|---|---|
| පරිපාලන වියදම් | | |
| කුළිය | X | |
| වැටුප | XX | |
| ජලය | X | |
| විදුලිය | X | |
| දුරකතන | X | (XX) |
| | | |
| මුල්‍ය වියදම් | | |
| බැංකු ගාස්තු | X | |
| පොළී වියදම් | X | |
| අයිරා පොළී වියදම් | X | (X) |
| | | |
| වෙනත් වියදම් | | |
| පරිත්‍යාග | X | |
| තොග හානි | X | |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් අලාභ | X | (X) |
| | | |
| වසරේ ශුද්ධ ලාභය | | XX |

JMC vLearning "your virtual learning partner"

## ලාභලාභ ගිණුමට අදාල ද්විත්ව සටහන්

| අයිතමය | විස්තරය | ද්විත්ව සටහන |
|---|---|---|
| දළ ලාභය | වෙළඳ ගිණුමේ ඇති දළ ලාභය ලාභලාභ ගිණුමට මාරු කෙරේ. | වෙළඳ ගිණුම හර ලාභාලාභ ගිණුම බැර |
| වෙනත් ආදායම් | ව්‍යාපාරයේ ප්‍රධාන අදායම් නොවන අනිකුත් අදායම් ලෙස සැළකේ. මෙයට පොළී අදායම්, ලභාංශ අදායම්, ලද වට්ටම් යනාදිය ඇතුලත් වේ. වෙනත් අදායම් ලාභාලාභ ගිණුමට එකතු කෙරේ. | වෙනත් ආදායම් හර ලාභාලාභ ගිණුමට බැර |
| අයභාර වියදම් | ව්‍යාපාරයේ අයභාර ස්වරූපයේ වියදම වන පරිපාලන, බෙදාහැරීම්, මූල්‍ය හා වෙනත් වියදම් වර්ෂයේ ලාභයෙන් අඩු කළ යුතුය. | ලාභලාභ ගිණුම හර වියදම් ගිණුම බැර |






## මූල්‍ය තත්තව ප්‍රකාශය තුල තිබෙන අයිතම

**ජංගම නොවන වත්කම්**

**ජංගම වත්කම්**

**හිමිකම්**

**ජංගම නොවන වගකීම්**

**ජංගම වගකීම්**

# තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය තත්තව ප්‍රකාශයේ ආකෘතිය

ABC ව්‍යාපාරය
31/3/X4 දිනට
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය රු.000'**

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශු.පො.අ |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| ඉඩම් | XXX | | XXX |
| ගොඩනැගිලි | XXX | (XX) | XXX |
| මෝටර් රථ | XXX | (XX) | XXX |
| | XXX | (XX) | XXX |
| ස්ථාවර තැන්පතු | | | XX |
| | | | XXX |
| ජංගම වත්කම් | | | |
| තොගය | | XX | |
| වෙළඳ ලැබිය යුතු | XX | | |
| (-) අඩමාණ ණය වෙන් කිරීම | (X) | XX | |
| පෙර ගෙවීම් | | X | |
| මුදල් හා මුදල් සමාන දෑ | | X | XX |
| මුළු වත්කම් | | | XXX |

| | | | |
|---|---|---|---|
| **හිමිකම්** | | | |
| **ප්‍රාග්ධනය** | | XX | |
| **+ වර්ෂයේ ලාභය** | | X | |
| **(-)ගැනිලි** | | (X) | XX |
| | | | |
| **ජංගම නොවන <u>වගකීම්</u>** | | | |
| **සේවක පාරිතෝෂික** | | X | |
| **බැංකු ණය** | | XX | XX |
| | | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| **වෙළඳ ගෙවිය යුතු** | | XX | |
| **උපචිත වියදම්** | | X | |
| **බැංකු අයිරාව** | | X | XX |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | XXX |

JMC vLearning "your virtual learning partner"





# මූල්‍ය ප්‍රකාශනවලට කරන ගැලපිලි

**වියදම් වර්ගීකරණය**

- ප්‍රාග්ධන වියදම්
- අයභාර වියදම්

**අනිකුත් ගැලපුම්**

- අවසාන තොගය
- උපචිත වියදම් සහ පෙරගෙවීම්
- උපචිත ආදායම් සහ ලද අත්තිකාරම්
- බොල් ණය සහ අඩමාණ ණය
- දේපළ පිරියත සහ උපකරණ ක්ෂය



JMC Jayasekera Management Centre (Pvt) Ltd

# වියදම් වර්ගීකරණය

ව්‍යාපාරයක් විවිධාකාරයේ වියදම් දරණු ලබයි. එම වියදම් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන වියදම් සහ අයභාර වියදම් ලෙස කොටස් 2කට වර්ගීකරණය කළ හැකිය.

ප්‍රාග්ධන වියදම් යනු, කාලයක් පුරාවට ප්‍රතිලාභ ලබාදෙන වියදම් වේ. ප්‍රාග්ධන වියදම වත්කම් ලෙස ව්‍යාපාරය හදුනාගනී. අයභාර වියදම යනු, ව්‍යාපාරයේ ආදායම ජනනය කිරීම සදහා දරණ ලද සාමාන්‍ය වියදම් වේ. ඒවා වත්කම් ලෙස හදුනාගත නොහැකි අතර ඒවා අදාළ වර්ශයේ ලාභලාභ ගිණුමට වියදමක් ලෙස හදුනා ගනී.

JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ප්‍රාග්ධන වියදම්

- ප්‍රාග්ධන වියදම් යනු වත්කම් අත්පත් කර ගැනීම් සහ වත්කම් වැඩි දියුණු කිරීම වේ. වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල ප්‍රතිලාභ ලබාදෙන ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, වාහන වැනි වත්කම් අත්පත් කරගැනීම් ප්‍රාග්ධන වියදමකි
- එම වත්කම් අත්පත්කර ගැනීමේදි අනිවාර්යයෙන්ම දැරීමට සිදුවන වියදම් ද ප්‍රාග්ධන වියදම් ලෙස සළකා වත්කමට එකතු කෙරේ
- එමෙන්ම එම වත්කමක ප්‍රතිලාභ ඉහල නැංවීම සඳහා දරණ ලද අනිකුත් වියදම් ද ප්‍රාග්ධන වියදම් ලෙස සළකා වත්කමට එකතු කෙරේ.

# ප්‍රශ්ණ අංක 03

යන්ත්‍රයක් මිලට ගැනීමට අදාළව පහත තොරතුරු ඔබට ලබාදී ඇත

| | රු. |
|---|---|
| ගැනුම් මිල | 500,000 |
| (ඉහත මිලෙන් (10%) වෙළඳ වට්ටමකින් පසු යන්ත්‍රය ගෙන ඇත) | |
| ගැල් කුලිය | 5,500 |
| මාර්ගස්ථ රක්ෂණය | 1,000 |
| ස්ථාපනය කිරීමේ වියදම | 5,000 |
| තාක්ෂණික නිලධාරී වියදම | 3,500 |
| යන්ත්‍රයේ සාමාන්‍ය නඩත්තු වියදම | 2,600 |

යන්ත්‍රයේ පිරිවැය ගණනය කරන්න.

Sandeepa Jayasekera - JMC 29

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 04

යන්ත්‍රයක් මිලට ගැනීම සම්බන්ධයෙන් පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

| | |
|---|---|
| ගැනුම් මිල (වෙළඳ වට්ටමට පෙර) | 700,000 |
| වෙළඳ වට්ටම | 35,000 |
| යන්ත්‍රය ප්‍රවාහනය කිරීමේ වියදම | 120,000 |
| නිශ්කාෂණ ගාස්තුව | 25,000 |
| පරිශ්‍රය සකස් කිරීමේ වියදම | 50,000 |
| යන්ත්‍රය ස්ථාපනය කිරීමේ වියදම | 80,000 |
| මුලික වටයේ පරීක්ෂණ සඳහා වැය වූ තාක්ෂණික වියදම | 10,000 |
| යන්ත්‍රය විවෘත කිරීමේ සමාරම්භක උත්සවයට ගිය වියදම | 30,000 |
| ගණකාධිකාරීන්ගේ වැටුප | 10,000 |

උපකරණයේ පිරිවැය ගණනය කරන්න.

Sandeepa Jayasekera - JMC 30




## වත්කම මත පසුකාලීනව දරණ ප්‍රාග්ධන වියදම්

වත්කම මත දරණ පසුකාලීන වියදමක් නිසා එම වත්කමේ ගුණත්වය වැඩි වේ නම් හෝ ප්‍රයෝජනවත් ආයු කාලය වැඩි වන්නේ නම් හෝ ධාරිතාවය වැඩි වන්නේ නම් හෝ මෙහෙයුම් වියදම් අඩු වන්නේ නම් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය හැකි වේ. එවැනි වියදමක් වත්කමට එකතු කළ හැකිය. එසේ නොවන අනිකුත් වියදම් ලාභාලාභ ගිණුමට කපා හළ යුතු වේ.

JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 05

පහත සඳහන් එක් එක් වියදම් ප්‍රාග්ධන වියදමක් ද අයභාර වියදමක්ද යන්න සදහන් කරන්න

1. යන්ත්‍රයේ ගැනුම් වියදම .........................
2. නව යන්ත්‍රය වරායෙන් නිදහස් කර ගැනීමට ගෙවු නිශ්කාශණ ගාස්තුව .........................
3. නව යන්ත්‍රය පරිශ්‍රය වෙත ප්‍රවාහනය කිරීමට වැය වූ වියදම .........................
4. නව යන්ත්‍රය සවිකිරීමට පරිශ්‍රය සකස් කිරීමට ගිය වියදම .........................
5. නව යන්ත්‍රය සවි කිරීමට යන වියදම .........................
6. නව යන්ත්‍රය සවි කිරීමේදි වෘත්තිකයන්ට හා තාක්ෂණික නිළධාරීන් වෙනුවෙන් ගෙවු වියදම .........................
7. යන්ත්‍රය සවිකළ සේවකයන්ට කළ ගෙවීම .........................
8. යන්ත්‍රයේ නඩත්තු වියදම .........................
9. යන්ත්‍රයේ අළුත්වැඩියා වියදම .........................



10. යන්ත්‍රයට නව කොටසක් සවි කිරීමට ගිය වියදම. මෙම කොටස නිසා යන්ත්‍රයේ කාර්යක්ශමතාවය වැඩි වේ .........................
11. යන්ත්‍රය භාර නිළධාරියාගේ වැටුප .........................
12. යන්ත්‍රය සඳහා අවශය තෙල් වියදම .........................
13. ඉඩම වටා තාප්පයක ඉදිකිරීමට ගිය වියදම .........................
14. ඉඩමේ වැවී තිබු තණකොළ ඉවත් කිරීමට ගිය වියදම .........................
15. ගොඩනැගිල්ලේ මිනින්දෝරු සැලැස්ම අනුමත කර ගැනීමට ගිය වියදම .........................
16. ගොඩනැගිල්ල පින්තාරු කිරීමේ වියදම .........................
17. ඉඩම මිලදි ගැනිමේදි නීතිඥයාට ගෙවු ගාස්තුව .........................
18. ව්‍යාපාරයට මිලදි ගත් ස්ටේප්ලරයට ගිය වියදම .........................




JMC vLearning
"your virtual learning partner"

# මූල්‍ය ප්‍රකාශන ගැලපිළි






JWC vLearning
"your virtual learning partner"



# අවසාන තොග ගැලපීම

ව්‍යාපාරයේ මිලදීගත් අයිතමවලින් කොටසක් වර්ෂ අවසාන නොවිකිණී ඉතිරි වී තිබිය හැකිය. එය අවසාන තොගය වන අතර එය විකුණුම් පිරිවැයෙන් ඉවත් කළ යුතු අතර අනෙක් අතට එය ජංගම වත්කමක් ලෙස හඳුනාගත යුතුවේ. ඒ අනුව පහත ද්විත්ව සටහන යොදනු ලබයි

තොග හර
විකුණුම් පිරිවැය බැර

# ප්‍රශ්ණ අංක 06

මනුක ව්‍යාපාරය මී පැණි අලෙවි කරයි. මේ වසරේ ආරම්භක තොගය රු. 5,000කි. මේ වර්ෂයේදි රු. 100,000ක අයිතම මිලදි ගන්නා ලදි. වර්ෂ අවසාන තොගය රු. 10,000කි

අවශ්‍ය වන්නේ,

1. අවසාන තොගයට ද්විත්ව සටහන
2. විකුණුම් පිරිවැය ගණනය කරන්න




ගෙවිය යුතු විදුලිය ගිණුම් තියෙන්නේ කොහොමද?

# උපචිත වියදම් (ගෙවිය යුතු වියදම්)

යම් කාලපරිච්ඡේදයකට අදාල වියදමක් ගෙවා නොතිබෙන විටක එය උපචිත හෙවත් ගෙවිය යුතු වියදමක් ලෙස සැලකේ. උපචිත සංකල්පය අනුව මුදලින් නොගෙව්වද එම වියදම හඳුනාගත යුතුය. එමෙන්ම ගෙවිය යුතු වියදම ජංගම වගකීමක් ලෙස හඳුනාගත යුතුය ඒ අනුව පහත ද්විත්ව සටහන යොදයි.

අදාල වියදම් ගිණුම හර
උපචිත වියදම බැර

## ප්‍රශ්ණ අංක 07

20X4 මාර්තු මාසයේ විදුලි බිල රුපියල් 20,000කි. එය තාමත් ගෙවා නොමැත.

අවශ්‍ය වන්නේ,

උපචිත විය විදුලිය සඳහා ද්විත්ව සටහන සඳහන් කරන්න.



## ප්‍රශ්ණ අංක 08

ව්‍යාපාරය විසින් රු. 500,000 ණයක් ලබා ගන්නා ලදි. එහිදි පොළී අනුපාතය 10% කි. 20X4/10/1 දින මෙම ණය ලබා ගන්නා ලදි. මෙම වර්ෂය සඳහා ගෙවූ පොළිය රුපියල් 15,000කි. මූල්‍ය වර්ෂය මාර්තු 31න් අවසන් වේ

අවශ්‍ය වන්නේ,

1. 20X5/3/31න් අවසන් වර්ෂය සඳහා පොළී වියදම
2. 20X5/3/31 දිනට උපචිත පොළිය
3. පොළී වියදම වාර්තා කිරීමට අදාළ ද්විත්ව සටහන්



JMC vLearning your virtual learning partner




ලැබිය යුතු
කුලී ආදායමක්
ගිණුම් තියෙන්නේ
කොහොමද?

JMC vLearning
"Your virtual learning partner"




## ලැබිය යුතු ආදායම් (උපචිත ආදායම්)

යම් මූල්‍ය වර්ෂයකට අදාළව ලැබිය යුතු එහෙත් තවමත් නොලැබී තිබෙන ආදායම්ද උපචිත සංකල්පය අනුව ගිණුම් තැබිය යුතුවේ. ඒ අනුව අදාළ ආදායම් ආදායම් ගිණුමේ සහ ලැබිය යුතු ආදායම ජංගම වත්කමක් ලෙස හඳුනා ගත යුතුවේ. ඒ අනුව පහත ද්විත්ව සටහන යොදයි.

ලැබිය යුතු ආදායම් හර
අදාළ ආදායම් බැර

Sandeepa Jayasekera - JMC

## ප්‍රශ්ණ අංක 09

සහන් විසින් සිය ගොඩනැගිල්ල මාසිකව රු.100,000 කුලියට දී තිබේ. මෙම වර්ෂය තුළ දී රු. 1000,000 පමණක් කුලී ආදායම ලෙස ලැබී ඇත. අවසන් මාස දෙකේ කුලී ආදායම තවමත් ලැබී නොමැත.

**අවශ්‍ය වන්නේ,**

1. ලැබිය යුතු කුලිය
2. කුලී ආදායමට අදාළ ද්විත්ව සටහන

Sandeepa Jayasekera - JMC 45

## ප්‍රශ්ණ අංක 10

චමිදු ආයෝජනය කළ ස්ථාවර තැන්පතු පිළිබඳ විස්තර පහත පරිදි වේ.

1. 20X3/1/1 දින රු. 100,000 ක සය මාසික ස්ථාවර තැන්පතුව (පොළිය 20%)
2. 20X2/7/1 දින රු. 500,000ක වාර්ෂික ස්ථාවර තැන්පතුව (පොළිය 18%)

මූල්‍ය වර්ෂය 20X3/3/31න් අවසන් වේ.

**අවශ්‍ය වන්නේ,**

1. ලැබිය යුතු පොළී ආදායම
2. පොළී ආදායමට අදාළ ද්විත්ව සටහන්

46
Sandeepa Jayasekera - JMC

JMC vLearning "your virtual learning partner"




## පෙර ගෙවීම් (කලින් කළ වියදම්)

අනාගත කාල පරිච්ඡේදයට අදාළ වියදමක් කලින් සිදු කළ විට එය පෙර ගෙවීමක් හෝ කලින් කළ වියදමක් ලෙස හඳුනා ගනී. උපචිත සංකල්පය අනුව එය, මෙම වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගත නොහැක. ඉදිරි මූල්‍ය වර්ෂයක් සඳහා කළ වියදම ව්‍යාපාරයේ ජංගම වත්කමක් වන අතර අනෙක් අතට එය මුදල් අඩුවීමක් ලෙස වාර්තා කළ යුතුවේ.

කලින් කළ වියදම හර
මුදල් බැර

# ප්‍රශ්ණ අංක 11

20X4/1/1 දින ශක්ති විසින් ගොඩනැගිල්ලක් මිලදී ගන්නා ලදී. එම ගොඩනැගිල්ලට අදාළව වර්ෂයේම වරිපනම් ගාස්තුව වූ රු. 16,000 එදිනම ගෙවා දමන ලදී. ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය 3/31න් අවසන් වේ.

**අවශ්‍ය වන්නේ,**

1. 20X4/3/31 දිනට කලින් කළ වරිපනම් ගාස්තුව ගණනය කරන්න
2. කලින් කළ වරිපනම් ගෙවීම සඳහා ද්විත්ව සටහන තීරණය කරන්න



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 12

20X4/1/1 සිට 20X4/12/31 දක්වා කාලය ආවරණය වන පරිදි ලබාගත් රක්ෂණාවරණය රු. 1200,000ක් විය. ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය 3/31න් අවසන් වේ. ව්‍යාපාරය විසින් සමස්ත රක්ෂණ ගෙවීම, මුදල් බැර කර රක්ෂණ වියදම් ගිණුමට හර කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

1. කලින් කළ රක්ෂණ වියදම ගණනය කරන්න
2. කලින් කළ රක්ෂණ වියදමේ ද්විත්ව සටහන සඳහන් කරන්න



## පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම් ගිණුම් තබන්නේ කොහොමද?

## ලද අත්තිකාරම් (කලින් ලද ආදායම්)

යම්කිසි විකිණීමකට අදාළව පාරිභෝගිකයා විසින් එම ගනුදෙනුවට අදාළව ව්‍යාපාරයට අත්තිකාරමක් ලබාදිය හැකිය. එසේ අත්තිකාරමක් ලද විට ව්‍යාපාරයේ මුදල් ශේෂය වැඩි වුවද එය ආදායමක් ලෙස හඳුනා ගත නොහැකි වේ. උපලබ්ධි සංකල්පයට අනුව පාරිභෝගිකයා හට භාණ්ඩය ලද විය පමණක් ආදායම හඳුනාගත හැකිය. පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම පාරිභෝගිකයා නැවත ඉල්ලූවිට ලබාදිය යුතු නිසා එය ජංගම වගකීමක් ලෙස හඳුනා ගත යුතුය. ඒ අනුව පහත ද්විත්ව සටහන් යොදයි.

මුදල් හර
ලද අත්තිකාරම් බැර

# ප්‍රශ්ණ අංක 13

සිදත් ව්‍යාපාරය පරිගණක අලෙවි කරයි. 20X3/3/28 වන දින පරිගණක ඇණවුමක් සඳහා රු. 200,000 අත්තිකාරමක් ලැබී තිබුණි. මීට අදාළව පරිගණක 20X3/4/2 දින පාරිභෝගිකයා වෙත ලබා දී තිබුණි. මූල්‍ය වර්ෂය 3/31න් අවසන් වේ.

**අවශ්‍ය වන්නේ,**

**පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම් සඳහා ද්විත්ව සටහන සඳහන් කරන්න.**



JMC vLearning
"your virtual learning partner"



ලෝකයේ බොහෝමයක් ව්‍යාපාර **ණයට විකුණුම්** සිදුකරයි. ණයට විකුණුම් තුළින් **ණයගැතියන්** බිහිවේ.



# බොල් ණය

ණයට විකුණුමක් සිදු කළ පසු, එම ණය නැවත අය කර ගැනීමට ව්‍යාපාරය කටයුතු කළ යුතුවේ. ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග භාවිතා කරයි. කෙසේ වුවද මූල්‍ය අර්බුධ හේතුවෙන් ඇතැම් ණයගැතියන් බංකොළොත් විය හැකිය. එසේ ණයගැතියා බංකොළොත් වූ විට එම ණය මුදල නැවත ව්‍යාපාරයට අය කරගත නොහැකි වනු ඇත. එය ව්‍යාපාරයට පාඩුවකි. නැවත අයකර ගත නොහැකි ණයගැති ශේෂයන් බොල් ණය ලෙස හඳුන්වයි. බොල් ණය විකිණීමේ බෙදා හැරීමේ වියදමක් ලෙසත් ණයගැතියන්ගෙන් අඩු කිරීමක් ලෙසත් හඳුනා ගනී.

බොල් ණය වියදම හර (බෙදාහැරීම් වියදම)
ණයගැති පාලන බැර

JMC vLearning "your learning partner"

# ප්‍රශ්ණ අංක 14

ක්‍රිශෝ ව්‍යාපාරය රු. 200,000ක අයිතම නිමල් හට ණයට විකුණන ලදි. නිමල් බංකොලොත්භාවයට පත් වූ නිසා එම ණය මුදල නැවත අය කර ගත නොහැකි විය.

ඉහත බොල් ණය මූල්‍ය ප්‍රකාශන තුළ හදුනා ගන්නේ කෙසේද?

Sandeepa Jayasekera - JMC 57

# බොල් ණය නැවත අයකර ගැනීම

ව්‍යාපාරයක් බොල් ණය ලෙස කපා හල ණය මුදලක් ඇතැම් විටෙක ණයගැතියා විසින් නැවත ගෙවිය හැකිය. එවැනි අවස්ථාවක මුදල් ශේෂය වැඩි කරමින් මුදල්ගිණුමට හර කළද, එය ණයගැති පාලන ගිණුමට බැර කළ නොහැක. එයට හේතුව වන්නේ බොල් ණය කපා හළ අවස්ථාවේදී අදාළ ණයගැතියා බැර කර තිබීමයි.

එසේ නම් නැවත අය කර ගත් බොල් ණයකින් සිදුවන්නේ බොල් ණය වියදම අඩුවීමයි. ඒ අනුව එය බොල් ණය වියදම අඩුවීමක් ලෙස ගිණුම් තබනු ලැබේ.

මුදල් හර
බොල් ණය වියදම බැර

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 15

පෙර උදාහරණයේ රු. 200,000 බොල්ණයෙන් රු.100,000ක මුදලක් නිමල්ගෙන් නැවත ලැබුණි.

ඉහත බොල් ණය නැවත ලැබීම ගිණුම් තබන්නේ කෙසේද?

Sandeepa Jayasekera - JMC 59

JMC vLearning "your virtual learning partner"

# අඩමාන ණය වෙන් කිරීම (ණයගැති හානිකරණය)

ඇතැම් විටෙක ණයගැතියා බංකොලොත් නොවුවද, ණය අයකර ගැනීමේ අවදානමක් ව්‍යාපාරයට තිබිය හැකිය. ඇතැම් ණයගැතියන්ගේ මූල්‍ය තත්ත්වය පිරිහී අලාභ ලබන තත්ත්වයේ සිටීම, මුදල් ලැබීම ප්‍රමාද වීම, ලබාදුන් චෙක්පත් අගරු වීම වැනි තත්ත්වයන් මත ණය අයකර ගැනීම පිළිබඳ අවදානමක් ව්‍යාපාරයට තිබිය හැකිය. ආරක්ෂණවාදී සංකල්පයට අනුව එවැනි අවස්ථාවක, විය හැකි අලාභය පිළිබඳ වෙන් කිරීමක් සිදුකළ යුතුවේ. මෙවැනි වෙන් කිරීම් අඩමාන ණය වෙන් කිරීම් ලෙස හඳුන්වයි.

# අඩමාන ණය වෙන්කිරීම්

| නිශ්චිත අඩමාන ණය වෙන්කිරීම් | පොදු අඩමාන ණය වෙන්කිරීම් |
| --- | --- |
| | |

# අඩමාන ණය සඳහා ගිණුම් තැබීම

| පළමුවරට අඩමාන ණය වෙන් කිරීමක් සිදු කරන විට | පසුකාලීනව අඩමාන ණය වෙන් කිරීමක් සිදු කරන විට |
| --- | --- |
| අඩමාන ණය වියදම් ගිණුම හර (බෙදාහැරීමේ වියදමක් ලෙස හඳුනා ගනියි)<br><br>අඩමාන ණය සඳහා වෙන්කිරීම් ගිණුම බැර (අඩමාන ණය වෙන් කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ණයගැති ශේෂයෙන් අඩුකර පෙන්වයි) | අවසාන අඩමාන ණය වෙන් කිරීමේ ශේෂය X<br>ආරම්භක අඩමාන ණය වෙන් කිරීමේ ශේෂය (X)<br>ඌණ/අධි වෙන්කිරීම X/(X) |

JMC vLearning "Your virtual learning partner"

# අඩමාන ණය සඳහා ගිණුම් තැබීම

## ඌණ වෙන් කිරීම

අවශ්‍ය වන අඩමාන ණය වෙන් කිරීමට වඩා, දැනට තිබෙන අඩමාන ණය වෙන් කිරීම අඩු වූ විට එය ඌණ අඩමාන ණය වෙන් කිරීමක් ලෙස සැළකේ. එය එක් අතකින් දැනට තිබෙන අඩමාන ණය වෙන් කිරීම බැර කර එම ශේෂය වැඩි කළ යුතු අතර අනෙක් අතට අඩමාන ණය වියදමක් ලෙස හඳුනා ගත යුතුය.

අඩමාන ණය වියදම හැර
අඩමාන ණය සඳහා වෙන් කිරීම බැර

## අධි වෙන් කිරීම

දැනට තිබෙන අඩමාන ණය වෙන් කිරීම, අවශ්‍ය අඩමාන ණය වෙන් කිරීමට වඩා වැඩි වූ විට, එම වෙනස අධි අඩමාන ණය වෙන් කිරීමක් ලෙස සලකයි. අධි අඩමාන ණය නිසා එක් අතකින් අඩමාන ණය වෙන් කිරීමේ ගිණුමේ දැනට තිබෙන ශේෂය අඩු විය යුතු අතර අනිත් අතට අඩමාන ණය වියදම අඩු විය යුතුයි

අඩමාන ණය වෙන් කිරීම හර
අඩමාන ණය වියදම බැර
(බෙදාහැරීමේ වියදමින් අඩුකර දක්වයි)

# බොල් ණය සහ අඩමාන ණය මූල්‍ය ප්‍රකාශ තුළ පෙන්වන ආකාරය

## ලාභාලාභ ගිණුම

| | |
|---|---|
| **බෙදාහැරීමේ වියදම්** | |
| බොල් ණය | X |
| බොල් ණය නැවත අය කර ගැනීම | (X) |
| අඩමාන ණය ඌණ වෙන් කිරීම් | X |
| අඩමාන ණය අධි වෙන් කිරීම් | (X) |

## මූල්‍ය තත්ත්වය

| | | | |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ ලැබිය යුතු | X | | |
| (-) අඩමාන ණය වෙන් කිරීම | (X) | X | |

- බොල් ණය සෘජුවම ණයගැතියන්ගෙන් අඩු කෙරේ.
- අඩමාන ණය වෙන් කිරීමේ අවසාන ශේෂය, ණයගැති ශේෂයෙන් ඉහත දැක්වෙන පරිදි අඩුකර දක්වයි.

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 16

රාජ්ගේ ව්‍යාපාරයේ 20X5/3/31 දිනට පහත තොරතුරු ලබා දී ඇත.

| | |
|---|---|
| ණයගැතියෝ | 110,000 |
| 20X4/4/1 දිනට අඩමාන ණය වෙන් කිරීම | 6,000 |

20X5/3/31 දින රු. 5,000ක ණයගැතියෙකු බොල් ණය ලෙස කපා හැරීමටත් ඉතිරි ණයගැතියන් සඳහා 5% අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීමට ව්‍යාපාරය තීරණය කර ඇත

**අවශ්‍ය වන්නේ,**

1. බොල් ණය සඳහා ද්විත්ව සටහන
2. අඩමාන ණය ඌණ/අධි වෙන් කිරීම
3. ලෙජර් ගිණුම් තුල ඉහත ගනුදෙනු වාර්තා කිරීම
4. මූල්‍ය ප්‍රකාශ උද්ධෘත

Sandeepa Jayasekera - JMC 65

# ප්‍රශ්ණ අංක 17

අනගිගේ ව්‍යාපාරය සඳහා 20X4/3/31 දිනට පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ණයගැතියෝ | 1000,000 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම | 80,000 |

ණයගැති සිදත්ගෙන් ලැබිය යුතු රු. 200,000ක ශේෂය බොල්ණය ලෙස කපා හැර තිබේ. ණයගැති දමිත්ගෙන් ලැබිය යුතු රු. 50,000ක ශේෂය සඳහා අඩමාන ණය වෙන්කිරීමක් අවශ්‍ය වේ. ඉතිරි ණයගැති ශේෂය සඳහා 5%ක අඩමාන ණය වෙන් කිරීමක් අවශ්‍ය වේ

**අවශ්‍ය වන්නේ,**

ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අදාළ ද්විත්ව සටහන් සහ මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

Sandeepa Jayasekera - JMC 66

JMC vLearning "your virtual learning partner"

# ක්ෂය ගිණුම් තියන්නේ කොහොමද?



Sandeepa Jayasekera - JMC 67

## ක්ෂය

දේපළ පිරියත සහ උපකරණ යනු වර්ෂයකට වැඩි කාලයක් ප්‍රතිලාභ ලබාදෙන ස්ථාවර වත්කම් වේ. මේ ස්ථාවර වත්කම ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ව්‍යාපාරයට ප්‍රතිලාභ ලබාදෙන අතර එම කාලය ගෙවීමක් සමග භෞතිකව වැහැරී වත්කමේ වටිනාකමද අඩු වේ. ගැලපුම් සංකල්පයට අනුව දේපළ පිරියත සහ උපකරණ වල ක්ෂය කළ හැකි අගය ඵලදායී ජීව කාලය පුරාවට ක්‍රමිකව ලාභාලාභ ගිණුමට වියදමක් ලෙස හඳුනා ගත යුතු වේ. එම වියදම ක්ෂය ලෙස හදුන්වයි. එක් අතකට ක්ෂය යනු වියදමකි. අනික් අතට එය වත්කමේ අඩු වීමකි.

| | | |
|---|---|---|
| ක්ෂය කළ හැකි අගය | = | පිරිවැය − සුන්බුන් අගය |
| සුන්බුන් අගය | = | ඵලදායි ජීව කාලය අවසානයේ වත්කම ඉවත් කිරීමෙන් ලැබෙන ශුද්ධ මුදල |
| ඵලදායී ජීව කාලය | = | වත්කමෙන් ප්‍රතිලාභ ලබාගැනීමට එම වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලය |

JMC vLearning "your virtual learning partner"

**ක්ෂය ක්‍රම**

| සරල මාර්ග | |
|---|---|
| උපකල්පනය | වත්කමේ ප්‍රතිලාභ ඵලදායී ජීව කාලය පුරා එක හා සමානව ලැබෙන බව |
| සමාන ක්ෂය වියදමක් ඵලදායී ජීව කාලය පුරා හඳුනාගනී. | |
| ක්ෂය = | ක්ෂය කළ හැකි අගය/ජීව කාලය |
| | ක්ෂය කළ හැකි අගය X ක්ෂය % |

| හීනවන ශේෂ | |
|---|---|
| උපකල්පනය | වත්කමේ ප්‍රතිලාභ ලැබෙන්නේ මුල් කාලයේදී වැඩි ප්‍රතිලාභ සිට ක්‍රමයෙන් අඩුවන පරිදි බව |
| මුලින් වැඩි ක්ෂය වියදමක් සහ එය ක්‍රමයෙන් අඩුවන පරිදි හඳුනාගනී. | |
| ක්ෂය = | ආරම්භක ශුද්ධ පොත් අගය X ක්ෂය % |

Sandeepa Jayasekera - JMC

# ක්ෂය ද්විත්ව සටහන

ක්ෂය, වත්කමේ ස්වරූපය අනුව පරිපාලන වියදමක් ලෙස හෝ බෙදාහැරීම් වියදමක් ලෙස හෝ විකුණුම් පිරිවැය තුළ හඳුනාගත යුතුවේ.
ක්ෂය හේතුවෙන් වත්කමේ වටිනාකම අඩුවන අතර එය සෘජුවම වත්කමින් අඩු නොකර සමුච්චිත ක්ෂය ගිණුමක බැරට සටහන් කරයි. මෙම සමුච්චිත ක්ෂය ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශයේදි වත්කමේ පිරිවැයෙන් අඩුකර පෙන්වයි.

ක්ෂය වියදම හැර

ක්ෂය වෙන් කිරීම හෙවත් සමුච්චිත ක්ෂය බැර

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 18

ශෙවාන්ගේ ව්‍යාපාරයේ දේපළ පිරියත පිළිබඳ පහත තොරතුරු ලබාදී ඇත

1. රු. 550,000ක පිරිවැය වූ යන්ත්‍රයක සුන්බුන් වටිනාකම රු. 50,000කි. එහි ඵලදායී ජීව කාලය අවුරුදු 10කි. සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ක්ෂය ගණනය කරන්න

2. රු. 100,000ක් පිරිවැය වූ උපකරණයක 20% හීනවන ශේෂය අනුපාතයට වසර 2ක් සඳහා කෂය ගණනය කරන්න.



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්ණ අංක 19

මිනෝලි ව්‍යාපාරයේ ෆොටෝ කොපි යන්ත්‍රයක් පිරිවැය රු. 1000,000කි. ඒ සුන්බුන් වටිනාකම රු. 100,000කි. ඵලදායි වීම කාලය අවුරුදු දෙකකි.

මෙම ෆොටෝ කොපි යන්ත්‍රයේ උපරිම ධාරිතාවය ඒකක 200,000කි. පළමු වසරේදි ඒකක 150,000ක් සහ දෙවන වසරේදි ඒකක 50,000ක් වශයෙන් භාවිතා කර ඇත.

නිෂ්පාදන ඒකක ක්‍රමය භාවිතා කර පළමු සහ දෙවන වසර සඳහා ක්ෂය ගණනය කරන්න.

## 2024 ජූලි ප්‍රශ්න අංක 1.6

සෑම් ව්‍යාපාරය 2022 අප්‍රේල් 01 දින රු. 4,000,000/- කට මෝටර් රථයක් මිලදී ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වාර්ෂිකව 20% අනුපාතයට හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදන කිරීමයි. 2024 මාර්තු 31 දිනට මෝටර් රථයේ ධාරණ අගය (ශුද්ධ පොත් අගය) වූයේ,

1. රු. 2,400,000/-
2. රු. 3,200,000/-
3. රු. 2,560,000/-
4. රු. 3,000,000/-



## 2024 ජනවාරි ප්‍රශ්න අංක 1.17

කමල් ට්‍රේඩර්ස් 2022 අප්‍රියෙල් 01 දින රු. 6,000,000 කට යන්ත්‍රයක් අත්පත් කර ගන්නා ලදි. ප්‍රයොජනවත් ආයු කාලය අවසානයේදි එහි සුන්බුන් අගය රු. 1,000,000 ක් වන අතර ප්‍රයෝජනවත් අයු කාලය වසර 05 කි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට (වර්ෂයකට 20% බැගින්) යන්ත්‍රයක් ක්ෂය කිරීමයි. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය ගණනය කරන්න.





JMC vLearning "your virtual learning partner"

## 2023 ජුලි ප්‍රශ්න අංක 1.8

තරූ ව්‍යාපාරය 2021 අප්‍රේල් 01 දින රු. 6,000,000/- කට යන්ත්‍රයක් මිලදී ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වාර්ෂිකව 20% අනුපාතයට හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදන කිරීමයි. 2023 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ක්ෂයවීම් වනුයේ

1. රු. 768,000/-
2. රු. 960,000/-
3. රු. 1,200,000/-
4. රු. 1,688,000/-



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි ප්‍රශ්න අංක 1.3

ඇන් ව්‍යාපාරය 2020 අප්‍රේල් 01 දින රු. 5,000,000/- කට මෝටර් රථයක් මිලදී ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වාර්ෂිකව 25% අනුපාතයට හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදන කිරීමයි. 2022 මාර්තු 31 දිනට මෝටර් රථයේ ක්ෂයවීම් වනුයේ

1. රු. 1,250,000/-
2. රු. 937,500/-
3. රු. 703,125/-
4. රු. 900,000/-

## 2022 ජූලි ප්‍රශ්න අංක 1.20

මහේලි ස්ටෝර්ස්, 2020 අප්‍රේල් 01 දින රු. 800,000/- කට යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ හීනවන ශේෂ ක්‍රමය භාවිතයෙන් වර්ෂයට 20% ක අනුපාතයකට යන්ත්‍ර ක්ෂය කිරීමය. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය කිරීම ගණනය කරන්න.



JMC vLearning "your virtual learning partner"

## 2024 ජූලි ප්‍රශ්න අංක 06

නිම්සර ෆර්නිචර් නිම්සරට අයිතිව ඇති කේවල ස්වාමි ව්‍යාපාරයක් වන අතර 2024 මාර්තු 31 දිනට නිම්සර ෆර්නිචර් ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| කාර්යාල උපකරණ | 8,000 | |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | 2,500 | |
| මෝටර් රථය | 2,000 | |
| 2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| කාර්යාල උපකරණ | | 2,000 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | | 1,250 |
| මෝටර් රථය | | 500 |
| විකුණුම් | | 77,500 |
| ගැනුම් | 46,300 | |
| 2023 අප්‍රේල් 01 දිනට තොගය | 7,900 | |

| | | |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 2,250 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,250 |
| බැංකුවේ ඇති මුදල් | 1,000 | |
| අතැති මුදල් | 70 | |
| බැංකු ණය මුදල් | | 500 |
| වැටුප් සහ වේතන | 12,800 | |
| රක්ෂණය | 240 | |
| ආරක්ෂක ගාස්තු | 800 | |
| විදුලිය | 2,250 | |
| විකුණුම් කොමිස් | 900 | |
| ගෙවූ කාර්යාල කුලිය | 2,600 | |
| 2023 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් | | 4,610 |
| එකතුව | 89,610 | 89,610 |



JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2024 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 2,200,000/- ක පිරිවැය අගය කරන ලදි
2. 2024 මාර්තු මාසය සඳහා වූ රු. 32,000/- ක විදුලි බිල 2024 මාර්තු 31 දින වන විටත් ගෙවා නොමැත
3. 2024 ජනවාරි 01 දින ABC **බැංකුවෙන්** රු. 500,000ක බැංකු ණයක් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ලබාගෙන ඇති අතර මාසිකව රු. 15,000ක පොලියක් ගෙවීමට සහ ලබාගත් ණය මුදල මාස 12 ක් තුළ සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීමට එකඟ වී තිබේ. **නිම්සර** ද 2024 ජනවාරි සිට 2024 මාර්තු දක්වා එකඟ වූ පොලිය හෝ ප්‍රාග්ධනය හෝ කිසිවක් ගෙවා නොමැත
4. ක්ෂය ප්‍රතිපත්තිය වන්නේ පහත සඳහන් පරිදි පිරිවැය මත සරලමාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.
   - කාර්යාල උපකරණ : වර්ෂයකට 20% බැගින්
   - ගෘහභාණ්ඩ සහ සවිකිරීම් : වර්ෂයකට 20% බැගින්
   - මෝටර් රථය : වර්ෂයකට 25% බැගින්

5. 2023 සැප්තැම්බර් 01 දින කාර්යාලය සඳහා කුළී ගිවිසුමකට එළඹුණු අතර ගිවිසුම් කාලය අවසානයේ එනම් වසර 2 කට පසු ආපසු ගෙවන කුළී අත්තිකාරම් (Key money) වශයෙන් මාස 6ක කුළීය ගෙවන ලදි. මාසික කුලිය රු. 200,000/- ක් වේ.

6. දිගු කාලයක් තිස්සේ හිඟව ඇති ණයගැතියෙකු රු. 50,000/- ක ශේෂය, බොල් ණයක් ලෙස ලියා හැරීමටත්, 2024 මාර්තු 31 දිනට ඇති ඉතිරි ලැබිය යුතු මුදල් මත 5% අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් සිදු කිරීමටත් නිමිසර තීරණය කළේය.

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2. 2024 මාර්තු 31 දිනට මූල්‍යය තත්ත්ව ප්‍රකාශනය

JMC vLearning "your virtual learning partner"

# 2024 ජනවාරි ප්‍රශ්න අංක 06

**නිහාල් ඉලෙක්ට්‍රිකල්ස්**, නිහාල්ට අයිතිව ඇති ඒකල ස්වාමි ව්‍යාපාරයෙකි. 2023 මාර්තු 31 දිනට නිහාල් **ඉලෙක්ට්‍රිකල්ස්හි** ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| පිරියත හා යන්ත්‍ර | 7,000 | |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | 4,000 | |
| කාර්යාල උපකරණ | 1,000 | |
| 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| පිරියත හා යන්ත්‍ර | | 2,200 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | | 600 |
| විකුණුම් | | 62,900 |
| ගැනුම් | 38,000 | |
| 2022 අප්‍රේල් 01 දිනට තොගය | 900 | |

| | | |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 2,800 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 9,500 | |
| බැංකුවේ ඇති මුදල් | | 15,900 |
| අතැති මුදල් | 3,500 | |
| බැංකු ණය | 460 | |
| ජලය | | 1,000 |
| වැටුප් සහ වේතන | 11,000 | |
| රක්ෂණය | 260 | |
| විදුලිය | 7,850 | |
| දුරකථන ගාස්තු | 350 | |
| කාර්යාල කුලිය | 2,200 | |
| බැංකු ගාස්තු | 40 | |
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම් | | 8,760 |
| එකතුව | 91,360 | 91,360 |

Sandeepa Jayasekera - JMC 83

1. 2023 මාර්තු 31 දිනට අවසන් තොගය, රු. 9,270,000/- ක පිරිවැයට අගය කරන ලදි
2. 2022 ඔක්තොම්බර් 01 දින, රු. 1,000,000/- ක බැංකු ණයක් වාර්ෂිකව 20% ක පොලි අනුපාතයක් යටතේ ලබාගන්නා ලදි. එදිනම එම බැංකු ණය මුදල භාවිතයෙන් රු.1,000,000/- ක කාර්යාල උපකරණ මිලදී ගන්නා ලදි. ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම 2023 අප්‍රේල් 01 දින ආරම්භ කළ අතර වර්ෂය සඳහා වන පොලිය ගිණුම් පොත්වල ගිණුම් පොත්වල ගිණුම් ගත කර නොමැත
3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.

| | |
|---|---|
| පිරියත සහ යන්ත්‍ර | : වර්ෂයකට 20% බැගින් |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | : වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | : වර්ෂයකට 25% බැගින් |

4. රු. 260,000/- ක ව රක්ෂණය 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළ වේ
5. සිල්වාගෙන් ලැබිය යුතු රු. 50,000/- ක් බොල්ණයක් ලෙස ලියාහැරීමට නිහාල් තීරණය කර තිබේ
6. 2023 මාර්තු මාසය සඳහා පහත වියදම් ගිණුම් පොත්වල උපචිත (ගෙවිය යුතු) ලෙස සටහන් කර නොතිබුණි.

| | |
|---|---|
| කුළිය | : රු. 200,000/- |
| විදුලිය | : රු. 135,000/- |

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2. 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

# 2023 ජූලි ප්‍රශ්න අංක 06

**ඉමින්දි බියුටි සෙන්ටර්,** ඉමින්දිට අයිතිය ඇති ස්වෛලස්වාමි ව්‍යාපාරයකි. 2023 මාර්තු 31 දිනට ඉමින්දි බියුටි සෙන්ටර් හි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණයට - පිරිවැයට | | |
| රූපලාවන්‍ය උපකරණ | 3,500 | |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | 5,200 | |
| 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| රූපලාවන්‍ය උපකරණ | | 625 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | | 400 |
| විකුණුම් | | 74,100 |
| ගැනුම් | 52,000 | |
| 2022 අප්‍රේල් 01 දිනට තොගය | 1,750 | |

| | | |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 3,500 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,050 |
| අතැති මුදල් | 75 | |
| බැංකු ණය මුදල් | | 560 |
| ආරක්ෂක වියදම් | 350 | |
| විදුලිය | 1,650 | |
| වැටුප් සහ වේතන | 7,000 | |
| බැංකු ණය පොලිය | 200 | |
| ගෙවූ කාර්යාල කුලිය | 2,600 | |
| ප්‍රවාහන වියදම් | 300 | |
| ජලය | 150 | |
| 2022 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 1,540 |
| එකතුව | 78,275 | 78,275 |



පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2023 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 6,750,000/- ක පිරිවැයකට අගය කරන ලදි

2. 2023 මාර්තු 31 දින **ඉමින්දිගේ** මිතුරියක් විසින් රු. 500,000/- ක ගෘහ භාණ්ඩ **ඉමින්දිගේ ව්‍යාපාරය** වෙත සැපයූ අතර, මෙම මුදල 2023 අප්‍රේල් මාසයේදි පියවීමට ඉමින්දි එකග වී ඇත. මෙම ගනුදෙනුව ගිණුම් පොත්වල සටහන් කර නොමැත

3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සදහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සදහා ප්‍රතිපාදනය කිරීමයි.

| | |
|---|---|
| රූපලාවන්‍ය උපකරණ | - වර්ෂයකට 25% බැගින් |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | - වර්ෂයකට 20% බැගින් |

4. 2022 අප්‍රේල් 01 දින, **ඉමින්දි** විසින් නව කුළී ගිවිසුමකට ඇතුළත් වන ලදි. මෙම ගිවිසුම පරිදි මාසික කුළිය රු. 200,000/- කි. 2023 අප්‍රේල් මාසය සදහා වන කුළිය ද මාර්තු මාසයේදි ගෙවා ඇත

5. විවෘත වෙළඳපොළේ පවතින රූපලාවන්‍ය නිෂ්පාදිත සඳහා වන හිඟකම නිසා **ඉමින්දි** තායිලන්තයේ සිදුකළ පොද්ගලික සංචාරයක් අතරතුරදී අයිතමයන් සමහරක් නම් ණයපත (Credit Card) භාවිතා කොට 2023 මාර්තු 20 දින මිලට ගන්නා ලදි. තායිලන්තයේදී මිලට ගත් මෙම අයිතම්වල පිරිවැය රු. 900,000/- ක් වූ අතර, මෙම මුදල ව්‍යාපාරයට යෙදවූ අමතර ප්‍රාග්ධනය ලෙස එකතු කිරීමට **ඉමින්දි** එකඟ විය. කෙසේ වුවද මෙම සම්පූර්ණ ගනුදෙනුව ඉමින්දිගේ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. තවද මෙම තොගය 2023 මාර්තු මාසය තුලදී විකුණා අවසන් කොට ඇති අතර විකුණුම්වලට අදල ගනුදෙනුව අදාල ගණුදෙනුව ගිණුම් පොත්වල නිවැරදිව සටහන් කර ඇත

6. **ඉමින්දි** විසින් සීමාසහිත ABC **සමාගමෙන්** අයවිය යුතුව තිබූ රු.155,000/- ක මුදල, බොල් ණයක් ලෙස පොත්වලින් කපා හැරීමටත් තීරණය කරන ලදි

7. 2023 මාර්තු මාසය සදහා රු.78,000/- ක විදුලි බිල 2023 මාර්තු 31 දින වනවිටත් ගෙවා නොතිබුණි

පහත සඳහන් දෑ පිළිවෙල කරන්න
1. 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2. 2023 මාර්තු 31 දිනට මූලය තත්ත්ව ප්‍රකාශය

# 2023 ජනවාරි ප්‍රශ්න අංක 06

අමල් ව්‍යාපාරය, අමල්ට හිමි කේවලස්වාමි ව්‍යාපාරයකි. 2022 මාර්තු 31 දිනට අමල් ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| යන්ත්‍ර | 3,000 | |
| පරිගණක | 1,800 | |
| 2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| යන්ත්‍ර | | 1,500 |
| පරිගණක | | 450 |
| විකුණුම් | | 252,000 |
| ගැනුම් | 177,000 | |
| ගැනුම් මත ආනයන තීරු බදු | 1,500 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 20,200 | |



JMC vLearning "your virtual learning partner"

| | | |
|---|---|---|
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 6,000 |
| අතැති හා බැංකුවේ මුදල් | 85 | |
| 2021 අප්‍රේල් 01 දිනට තොගය | 12,150 | |
| ජලය | 150 | |
| විදුලිය | 3,450 | |
| වැටුප් සහ වේතන | 45,000 | |
| කාර්යාල කුලිය | 6,000 | |
| ප්‍රවාහන වියදම් | 4,800 | |
| ගෙවූ බැංකු ණය පොලිය | 1,200 | |
| දුරකථන සහ අන්තර්ජාල ගාස්තු | 500 | |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 11,385 |
| බැංකු ණය | | 5,500 |
| එකතුව | 276,835 | 276,835 |



පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2022 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 7,750,000/-ක පිරිවැයකට අගය කරන ලදි
2. 2022 ජනවාරි 01 දින, **අමල්ට** අයත්ව තිබූ රු. 2,000,000/- ක් වටිනා බෙදාහැරීමේ වෑන් රථයක්, ව්‍යාපාරයට මාරු කරන ලද අතර, එය **අමල් ට්‍රේඩර්ස්** හි ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි
3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමය

යන්ත්‍ර - වර්ෂයකට 20% බැගින්
පරිගණක - වර්ෂයකට 25% බැගින්
මෝටර් වාහන - වර්ෂයකට 25% බැගින්

4. 2022 මාර්තු මාසය සඳහා රු 75,000/- ක් වූ විදුලි බිල්පත හා රු.22,000/- ක් වූ ජල් බිල්පත, 2022 මාර්තු 31 දින වන විට ගෙවා නොතිබුණි
5. ආර්ථික අවපාතය නිසා, ගනුදෙනුකරුවෙක් බුන්වත්භාවය ප්‍රකාශයට පත් කළ අතර, ඔහුගෙන් ලැබිය යුතුව තිබූ රු.75,000/-ක ශේෂය බොල් ණය ලෙස කපා හැරීමට අමල් තීරණය කරන ලදි
6. 2022 මාර්තු මාසය සඳහා බැංකු ණය පොලිය රු.100,000/- ක් වූ අතර, එය 2022 අප්‍රේල් මාසයේ දි ගෙවන ලදි

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

# 2022 ජූලි ප්‍රශ්න අංක 06

තිමිර ට්‍රේඩර්ස්, තිමිරට හිමි කේවල ස්වාමි ව්‍යාපාරයකි. 2022 මාර්තු 31 දිනට තිමිර ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පහත දැක්වේ

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණයට - පිරිවැයට | | |
| යන්ත්‍ර | 2,000 | |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | 800 | |
| 2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| යන්ත්‍ර | | 400 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම | | 320 |
| විකුණුම් | | 202,000 |
| ගැනුම් | 124,000 | |
| දුන් වට්ටම් | 4,000 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 20,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,000 |



JMC vLearning "your virtual learning partner"

| | | |
|---|---|---|
| අතැති මුදල් | 95 | |
| බැංකු අයිරාව | | 1,050 |
| 2021 අප්‍රේල් 01 දිනට තොගය | 13,950 | |
| විදුලිය | 3,250 | |
| වැටුප් සහ වේතන | 42,000 | |
| බැංකු අයිරාව මත පොලිය | 500 | |
| බැංකු ණය පොලිය | 1,100 | |
| ප්‍රවාහන සහ ගමන් වියදම් | 7,200 | |
| කාර්යාල කුලිය | 2,800 | |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 7,625 |
| බැංකු ණය | | 7,500 |
| එකතුව | 221,895 | 221,895 |

Sandeepa Jayasekera - JMC 95

JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරුද සපයා ඇත

1. 2022 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 8,250,000 පිරිවැයකට අගය කරන ලදි
2. 2021 අප්‍රේල් 01 දින, තිමිරට අයත්ව තිබූ ලොරි රථයෙන්, ව්‍යාපාරයට මාරු කරන ලද අතර, 2021 අප්‍රේල් 01 දින ලොරි රථයේ වටිනාකම රු. 1,000,000/- ක් විය. නමුත් මෙය ගිණුම් පොත්වල වාර්තා කර නොමැත
3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමය

යන්ත්‍ර - වර්ෂයකට 10% බැගින්
භාණ්ඩ හා සවිකිරීම - වර්ෂයකට (20%) බැගින්
මෝටර් වාහන - වර්ෂයකට 25% බැගින්

4. 2021 අප්‍රේල් 01 දින, **තිමිර ට්‍රේඩර්ස්** කාර්යාල පරිශ්‍රය සඳහා නව කුළී ගිවිසුමකට එළඹුණේය. නව කුළී ගිවිසුම අනුව මාසික කුළිය රු. 200,000 ක් වන අතර, 2022 අප්‍රේල් සහ මැයි මාස සඳහා වන කුළිය ද වර්ෂය තුල ගෙවන ලදි
5. 2022 මාර්තු මාසය සඳහා විදුලි බිල වූ රු. 85,000/- හා මුදල්, 2022 මාර්තු 31 දින වන විට ගෙවා තිබුණේ නැත
6. **සීමාසහිත** ABC **(පෞද්ගලික) සමාගමෙන්** ලැබිය යුතු රු. 200,000 ක් බොල් ණය ලෙස කපා හැරීමට තිමිර තීරණය කර ඇත

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2. 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්තව ප්‍රකාශය

# 2022 ජනවාරි ප්‍රශ්න අංක 06

සන්ශයින් ට්‍රේඩර්ස් කේවල ස්වාමි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට සන්ශයින් ට්‍රේඩර්ස්හි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණයට - පිරිවැයට | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.6,000,000/-) | 16,000 | |
| මෝටර් වාහන | 2,800 | |
| කාර්යාල උපකරණ | 900 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිල්ල | | 2,000 |
| මෝටර් වාහන | | 600 |
| කාර්යාල උපකරණ | | 450 |
| විකුණුම් | | 125,000 |
| ගැනුම් | 76,000 | |



JMC vLearning your virtual learning partner

| | | |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 7,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,200 |
| අතැති මුදල් | 900 | |
| බැංකු අයිරාව | | 1,750 |
| 2020 අප්‍රේල් 01 දිනට තොගය | 6,900 | |
| විදුලිය | 3,200 | |
| වැටුප් සහ වේතන | 30,000 | |
| දුරකථන ගාස්තු | 2,000 | |
| ප්‍රචාරණය | 4,000 | |
| ගෙවූ ප්‍රදර්ශනාගාර කුළිය | 550 | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,200 | |
| බැංකු අයිරාව මත පොලිය | 300 | |
| බැංකු ගාස්තු | 50 | |
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 19,000 |
| එකතුව | 152,000 | 152,000 |



JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

1. 2021 මාර්තු 31 දිනට අවසාන තොගය රු.7,200,000ක පිරිවැයකට අගය කරන ලදි

2. **සන්ශයින් ට්‍රේඩර්ස්**, 2021 ජනවාරි 01 දින මෝටර් බයිසිකලයක් රු. 300,000/- කට **සීමාසහිත සිටි රයිඩර්ස් සමාගමෙන්** ණයට මිලදී ගන්නා ලදි. මෙය **සන්ශයින් ට්‍රේඩර්ස**හි 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගිණුම් පොත්වල සටහන් කර නොමැත

3. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.

| | |
|---|---|
| ගොඩනැගිල්ල | : වර්ෂයකට 5% බැගින් |
| මෝටර් වාහන | : වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | : වර්ෂයකට 20% බැගින් |

4. 2020 අප්‍රේල 01 දින වර්ෂයක කාලයක් සඳහා ප්‍රදර්ශනාගාරයේ කුලී ගිවිසුමට එළඹෙන ලදි. මාසික ප්‍රදර්ශනාගාර 50,000/-කි

5. 2021 මාර්තු මාසය සඳහා පහත සඳහන් වියදම්, ගිණුම් පොත්වල උපචිත කර නොමැත

| | |
|---|---|
| විදුලි බිල්පත | : රු. 175,000/- |
| ප්‍රචාරණය | : රු. 25,000/- |

6. 2021 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය ඇගයීමෙන් පසු, **සන්ශයින් ට්‍රේඩර්ස්** හෝ හිමිකරු රු. 800,000/- ශේෂයක් බොල් ණය ලෙස ලියා හැරීමට තීරණය කරන ලදි

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් ද පිළියෙල කරන්න

1. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

JMC vLearning "your virtual learning partner"

# 2021 ජූලි ප්‍රශ්න අංක 06

මිල්කි ට්‍රේඩර්ස් කේවල ස්වාමි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට **මිල්කි ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණයට - පිරිවැයට | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.1,400,000/-) | 3,600 | |
| ලොරි රථය | 1,600 | |
| කාර්යාල උපකරණ | 2,000 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිල්ල | | 500 |
| ලොරි රථය | | 600 |
| කාර්යාල උපකරණ | | 1,200 |
| ගැනුම් | 73,000 | |
| විකුණුම් | | 114,000 |
| 2020 අප්‍රේල් 01 දිනට තොගය | 8,200 | |
| රක්ෂණය | 1,560 | |

| | | |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල් | 7,600 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 5,400 |
| විදුලි වියදම් | 9,600 | |
| දුරකථන ගාස්තු | 2,100 | |
| වැටුප් සහ වේතන | 22,500 | |
| බැංකු ගාස්තු | 1,200 | |
| ලැබුණු කුළී අදායම | | 1,000 |
| දුන් වට්ටම් | 390 | |
| ප්‍රචාරණය | 1,000 | |
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 20,000 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 7,800 | |
| එකතුව | 142,950 | 142,950 |



පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2021 මාර්තු 31 දිනට අවසාන තොගය රු. 10,200,000/- හා පිරිවැයකට අගය කරන ලදි
2. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

    ගොඩනැගිල්ල - වර්ෂයකට 10% බැගින්

    ලොරි රථය - වර්ෂයකට 20% බැගින්

    කාර්යාල උපකරණ - වර්ෂයකට 25% බැගින්
3. රු. 1,560,000/- ක රක්ෂණය, 2021 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාළ වේ
4. **මිල්කි ට්‍රේඩර්ස්** එහි ගොඩනැගිල්ලේ කොටසක්, **සීමාසහිත** XY **සමාගමට** මාසයකට රු 100,000/- බැගින් 2020 අප්‍රේල් 01 දින සිට කුලියට ලබා දී තිබේ. 2021 පෙබරවාරි සහ මාර්තු සඳහා වූ කුළී ආදායම, 2021 අප්‍රේල් මාසයේදී ලැබුණි
5. 2021 මාර්තු මාසය සඳහා පහත සඳහන් වියදම්, ගිණුම් පොත්වල උපචිත කර නොමැත:

    විදුලි බිල්පත : රු. 850,000/-

    වැටුප් සහ වේතන : රු. 1,800,000/-

6. කොවිඩ් - 19 (Covid - 19) වසංගත තත්ත්වය හේතුවෙන්, ගනුදෙනුකරුවෙක් බුන්වත්තයැයි ප්‍රකාශයට පත් කර ඇත. එමනිසා, ඔහුගෙන් ලැබිය යුතු රු.100,000/-, බොල් ණය ලෙස ලියා හැරීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදි

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න

1. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 06

**සහන් ට්‍රේඩර්ස්** යනු සහන්ට අයත් ක්වලස්වාමි ව්‍යාපාරයකි. 2020 මාර්තු 31 දිනට **සහන් ට්‍රේඩර්හි** ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණයට - පිරිවැයට | | |
| ඉඩම | 2,000 | |
| ගොඩනැගිල්ල | 4,750 | |
| මෝටර් වාහන | 2,500 | |
| කාර්යාල උපකරණ | 1,700 | |
| 2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිල්ල | | 1,250 |
| මෝටර් වාහන | | 520 |
| කාර්යාල උපකරණ | | 350 |
| විකුණුම් | | 48,000 |
| මිලදී ගැනුම් | 27,170 | |



JMC vLearning "your virtual learning partner"

| | | |
|---|---|---|
| 2019 අප්‍රේල් 01 දිනට තොගය | 2,900 | |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 9,000 |
| ස්ථාවර තැන්පතුව (2019 ඔක්තෝම්බර් 01 දින අයෝජනය කරන ලදි.) | 1,500 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 4,100 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,895 |
| විදුලිය | 1,200 | |
| වැටුප් සහ වේතන | 6,200 | |
| ප්‍රවාහන වියදම් | 500 | |
| ජලය | 190 | |
| බැංකු ගාස්තු | 25 | |
| ප්‍රදර්ශනාගාර කුළිය | 1,100 | |
| ස්ථාවර තැන්පතු මත පොළී ආදායම | | 50 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 5,230 | |
| එකතුව | 61,065 | 61,065 |



පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

1. 2020 මාර්තු 31 දිනට අවසාන තොගය පිරිවැයට රු.3,500,000/- කට අගය කරන ලදි
2. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ පහත පරිදි පිරිවැය මත සරල මාර්ය ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.

   ගොඩනැගිල්ල - වර්ෂයකට 10% බැගින්

   මෝටර් වාහන - වර්ෂයකට 25% බැගින්

   කාර්යාල උපකරණ - වර්ෂයකට 10% බැගින්
3. ස්ථාවර තැන්පතුව සඳහා අදාළ වන පොලී අනුපාතය වර්ෂයකට 8% ක් වන අතර, 2020 මාර්තු මාසය සඳහා ලැබිය යුතු පොලිය සහන් ට්‍රේඩර්ස් හි ගිණුම් පොත්වල ගිණුම්ගත කර නොතිබුණි
4. ගිණුම් පොත්වල වාර්තාකර නොතිබු 2020 මාර්තු මාසය සදහා ගෙවිය යුතු බිල් පහත පරිදි වේ

   විදුලිය : රු.75,000/-

   ජලය : රු. 21,000/-
5. සහන් ට්‍රේඩර්ස් 2019 අප්‍රේල් 01 දින ප්‍රදර්ශනාගාරය සදහා කුළී ගිවිසුමට එළඹුණු අතර ප්‍රදර්ශනාගාරයේ මාසික කුළිය රු. 100,000/- කි

ඔබ විසින් කළ යුතු දෑ

පහත සඳහන් දෑ පිළියෙල කරන්න:

1. 2020 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම ප්‍රකාශනයී
2. 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

JMC vLearning
"your virtual learning partner"